


# කතන්දර අත්තම්මා
## සහ
# දඟකාර ළමයි

නෙතන්‍යා මිනෝලි

# කතන්දර අත්තම්මා
සහ
# දඟකාර ළමයි

© නෙතන්යා මිනෝලි

ප්‍රථම මුද්‍රණය :- 2025 පෙබරවාරි

ISBN :- 9786242083803

කතාව, පිටකවරය සහ චිත්‍ර :- නෙතන්යා මිනෝලි
මහ/ මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
8 ශ්‍රේණිය A

# පිදුම

"මගේ දූ හරිම දක්ෂයි. ඔයාට පුලුවන්"
කියමින්
සැමදා මා දිරිමත් කළ
දයාබර සමන්මලී ගුරු මෑණියන්ට
හද බැතියෙන්
පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපිපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.


විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,


මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.




එකෝමත් එක රටක හරිම සුන්දර ගම්මානයක් තිබුණා.
ඒ ගමේ නම තමයි, "මල් යාය" ගම. උදෑසන හිරු පිබිදිගෙන එන
මොහොතේ සිට හිරු අවරට යන මොහොත දක්වා මේ ගම්මානය
අපූරු මල් වත්තක් වගේ. සෑම අතම මල් සුවඳ පැතිරිලා.
මල්වල පැණි උරා බීමට පැමිණෙන
විවිධ වර්ගයේ සමනලුන්, කෘමීන් හා කුඩා කුරුල්ලන්
ගමේ පරිසරයට තව තවත් සුන්දරත්වයක් එක්කරනවා.




ගස්වල ගෙඩි වර්ග පිරී ඇති බැවින්,
රිළවුන්, ලේනුන් ආදී සතුන් ද පරිසරයේ බහුලව දක්නට ලැබේ.
ගමේ කුඩා දරුවන් ඒ මේ අත ඇවිදිමින්
ගස්වල ගෙඩි කඩාගෙන කෑමට මහත් කැමැත්තක් දක්වති.
ඔවුන් දවස පුරාම රිළවුන් ආදී සතුන් සමඟ සෙල්ලමින් ගත කිරීම
පුරුද්දක් කොට ගෙන සිටිති.



පාසල් නිමවී සවස් වරුවේ කෙළි සෙල්ලමින් ගතකරන මොවුන් පොත පත සමඟ දුරස් බවක් දක්වයි. සති අන්තවල මෙන්ම පාසල් නිවාඩු කාලයේ පවා මොවුන් දැඩි ලෙස කෙළි සෙල්ලමට නැඹුරු වී සිටීම දෙමාපියන්ට මහත් ගැටළුවක් බවට පත් වී තිබේ. දරුවන්ගේ දඟකාරකම් එන්න එන්නම වැඩිවන බව දුටු ඔවුහු මැසිවිලි නඟන්නට විය.





දෙමාපියන්ගේ මෙම මැසිවිල්ල ගමේ සිටින
ඉතාම ගුණයහපත් හා කරුණාවන්ත මැටිල්ඩා අත්තම්මා හට
ආරංචි විය. ඇය ද දරුවන්ගේ මෙම හැසිරීම පිළිබඳව
ඉතාම කණගාටුවට පත් වූවාය. දින කිහිපයක් ඇය මේ පිළිබඳව
කල්පනා කළාය. ඇයට හොඳ උපායක් සිහිවිය.




මුලින්ම ඇය නිවසේ ඉවත දමා තිබූ දේවල් වලින් කුඩා
අත් කරත්තයක් සාදා ගත්තාය.
ඇය එය විවිධ වර්ණ යොදා අලංකාර කළාය.
නිවසේ තමන් සතුව තිබූ පොත් ටිකක්
සොයා ගත් අත්තම්මා ඒවා පිළිවෙලකට
කුඩා අත් කරත්තයෙහි ඇසුරුවාය. ඉන්පසු ගමේ දරුවන්
කෙළි දෙලෙන් ගතකරන වෙල් ඉපනැල්ලට
එය තල්ලු තකරගෙන ගියාය.

පිදුරු ගොඩ පිටුපස සැඟවී සිටි ළමුන් සියලු දෙනා
අත්තම්මාගේ කරත්තය දැක ඒ දෙසට දිව එන්නට විය.
අත්තම්මාට මහත් සතුටක් දැනුණි.
කරත්තය වෙත දිව ආ ළමුන්ගේ මුහුණු වල තිබූ හිනාව
බොඳ වී යනු අත්තම්මා දුටුවාය. එයට හේතුව ඈ දනී.
නමුත් කෙසේ හෝ දරුවන් පොත් කියවීමට
නැඹුරු කරගනිමියි ඇය තරයේ සිතා ගත්තාය.







"දරුවන් එන්න මම ඔයාලට කතන්දරයක් කියා දෙන්නම්...
ඇවිත් මේ ගල උඩින් වාඩි වෙන්න"
යැයි පැවසූ අත්තම්මා ද ගලක් උඩින් වාඩි වූවාය.
කියවීමට අකමැති වුවද දරුවන් කතන්දර ඇසීමට
කැමති බව අත්තම්මා හොඳාකාරවම දනී.
ඔවුන් තුල වැඩි කැමැත්තක් නොවූවත්,
එකා දෙන්නා පැමිණ ගල උඩ වාඩි වනු දැක
අත්තම්මාගේ කට කොනට සිනහවක් නැගුනි.




අත්තම්මා කතන්දර පොතක් දිගහැරගෙන
ඉතාම රසවත් ලෙස කතන්දරය කියවීමට පටන් ගත්තාය.
ඇය කතන්දරයේ ඇතැම් කොටස් රඟපෑමට ද අමතක නොකළාය.
ළමයින් අත්තම්මාගේ රඟපෑම් වලට සිනාසෙමින් කතන්දරයට
සවන් දුන්හ. කතන්දරය කියවා අවසන් වන විට තරමක් සවස් වී තිබුණි.
අත්තම්මා දරුවන් හැකි ඉක්මණින් නිවෙස් වලට පිටත් කොට,
ඇය ද නිවස බලා පිටත් වූවාය. මඟ දිගට දරුවන් ගැන කල්පනා කරමින්
ඇය ගෙදර පැමිණියේ ඉතා සතුටිනි.



පසුදින සවස ද ඇය දරුවන්  සොයා යාමට සිතා ගත්තාය.
එදින දරුවන් වෙනුවෙන් විශේෂ යමක් කළ යුතු යැයි සිතූ
අත්තම්මා, ඔවුන් කෑමට වඩාත් ප්‍රියකරන ලැවරියා
පිළියෙල කර ගත්තාය. ඇය ඒවා ද කෙසෙල් කොළයක ඔතාගෙන
කරත්තයෙහිම පසෙකින් තබාගත්තාය.
සුපුරුදු තැනට අත්තම්මා පැමිණෙනු දුටු ළමුන්, වහා අත්තම්මා කරා
දිව එන්නට වූහ. අත්තම්මාට මහත් ප්‍රීතියක් දැනුනි. ඇය වහා
තමන් ගෙන ආ ලැවරියා පාර්සලය ගලක් උඩ දිගහැරියාය.
දරුවන් ලැවරියා එක බැගින් ගෙන ඉතා ආශාවෙන් කන්නට විය. මේ අතර
අත්තම්මා කතන්දර පොතක් ගෙන කතන්දරය කීමට
පටන් ගත්තාය. දරුවන් එයට සතුටින් සවන් දෙන්නට වූහ.





මේ ආකාරයට දින කිහිපයක්ම අත්තම්මා කතන්දර කියාදුන්නාය. සතියක් පමණ ගත වූ පසු ඇය, කතන්දර කියන අතරතුර එක් එක් පිටුව බැගින් දරුවන්ට කියවීමට අවස්තාව ලබාදුන්නාය. මුලින් දරුවන් මෙයට මැළිකමක් දැක්වුව ද දින කිහිපයක් ගත වන විට ඔවුන් එයට ක්‍රමයෙන් හුරු විය. ඉන්පසු කරත්තය රැගෙන අත්තම්මා එනු දුටු විටම දුවගෙන විත් පොත් තෝරා ගැනීමට




ටික දිනක් ගතවන විට දරුවන්  නිවෙස් වලට ගෙන ගොස් කියවීමට ද පොත් ලබා ගත්හ මේ වන විට තමා සන්තකයේ ඇති පොත් ප්‍රමාණය මදිබව අත්තම්මාට වැටහිණී. ඇය ගමේ සිටි වැඩිහිටි පුද්ගලයින්ගේ නිවෙස් වලට ගොස් පොත් ලබාගැනීමට උපකාර ඉල්ලුවාය. ගමේ පන්සලේ හාමුදුරුවෝ, පාසලේ විදුහල්පතිතුමා හා ගුරුවරුන් ඒ අතර ප්‍රධාන විය.ඔවුන් හැකි පමණ අත්තම්මාට පොත් සොයා දුන්හ. දැන් අත්තම්මාට කරත්තේ දමාගෙන යාමට නොහැකි තරමට පොත් විශාල ප්‍රමාණයක් එකතු විය. දෙමාපියන් ද තම දරුවන්ගේ වෙනස්වීම පිළිබඳව ඉතා සතුටට පත්වූහ. ඔවුන් අත්තම්මා හමුවී ඇයට ගරු බුහුමන් දන්වා සිය සතුට ප්‍රකාශ කළහ. "මැටිල්ඩා අම්මා අපේ දරුවන් හට යහමඟ පෙන්නුවා. අම්මාට බොහොම පිං"යනුවෙන් ඔවුන් අත්තම්මාට පිං දුන්හ.

මේ අතර ගමේ  දෙමාපියන් මෙම හොඳ ක්‍රියාව පිළිබඳව සිතන්නට විය. පොත් ගෙන යාම අත්තම්මාට වෙහෙස දෙන කටයුත්තක් බව ඔවුන්ට වැටහිණි. ඔවුන් සියළු දෙනාම සාකච්ඡා කර ගමේ අතහැර දමා තිබූ ප්‍රජා ශාලාව පිළිසකර කොට පුස්තකාලයක් ආරම්භ කිරීමට සැලසුම් කළහ. දින කිහිපයක් යන විට එහි කටයුතු නිමවිය.
ඉතා අලංකාරවත් පුස්තකාලයක් මේස, පුටු, රාක්ක සහිතව ඉදිකර අවසන් විය.






ඒ සුවිශේෂී දිනය උදාවිය. ගමේ පුස්තකාලය විවෘත කිරීමේ උත්සවය ඉතාම උත්කර්ෂවත් අන්දමින් ආරම්භ විය. පීත්ත පටිය කපන සුභ මොහොත උදාවිය. ප්‍රධාන ආරාධිත අමුත්තා කැටුව පැමිණි වෙස් කණ්ඩායම සිය නැටුම අවසන් කළහ. සියලු දෙනාම ප්‍රධාන අමුත්තා දැක ඉතාම උද්යෝගයෙන් හා ප්‍රීතියෙන් යුතුව කෑගසමින් අත්පුඩි ගසන්නට විය. ප්‍රධාන අමුත්තා වෙන කිසිවෙකුත් නොව අපේ 'කතන්දර අත්තම්මා' ය. ඇයගේ ඇස් වලට ද කඳුළු ඉනුවේ ඇය නොදැනුවත්මය.



එතැන් පටන් අත්තම්මා ගමේ පුස්තකාලය භාර පුස්තකාලයාධිපතිනිය වූවාය. ඇය දිනපතා පුස්තකාලයට එන ළමුන් සඳහා පොත් එකතු කළාය. විවිධ ආයතන හා පුද්ගලයන්ගේ උදව්වෙන් පොත් විශාල ප්‍රමාණයක් පුස්තකාලයට එකතු කරගත්තාය. දරුවන් පොත් කියවීම පුරුද්දක් කරගත්හ. විභාග ආදියෙන් ඔවුන් ඉහළින් සමත්වීම සියළු දෙනාගේම සතුටට හේතුවිය. ඔවුන් යහමගට ගැනීමේ නිසි ගෞරවය හිමිවන්නේ අත්තම්මාටය. "අත්තම්මාට දහස් වාරයක් පිං" ජීවිතයේ සැඳෑ සමය ඇය දරුවන් හා පොත් සමඟ ඉතා ප්‍රීතියෙන් ගත කළාය.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්‍ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN 9786242083803